**Payment User Guide**

# හැඳින්වීම (Introduction)

**GovPay** යනු ශ්‍රී ලංකාවේ රජයේ සේවාවන් සඳහා ඩිජිටල් ගෙවීම් පහසුකම් සපයන මාර්ගගත වේදිකාවකි. පුරවැසියන්ට සහ ව්‍යාපාරවලට බදු, බිල්පත්, අධ්‍යාපන ගාස්තු වැනි ගෙවීම් ආරක්ෂිතව සහ පහසුවෙන් සිදුකිරීම සඳහා මෙය සැලසුම් කර ඇත.

මෙම වේදිකාව **ICTA**, **ශ්‍රී ලංකා මහ බැංකුව** සහ **LankaPay** සමාගමේ සහයෝගීත්වයෙන් ක්‍රියාත්මක වන අතර, රජයේ ආදායම් එකතු කිරීම වඩා නිවැරදිව, විනිවිදව සහ කාර්යක්ෂමව සිදුකිරීමට මෙය උපකාරී වේ. මේ පිළිබඳව සවිස්තරව පහත වෙබ් අඩවිය හරහා ඔබට ලබා ගත හැක

GovPay [https://govpay.lk/](https://govpay.lk/)

මෙවැනි ඩිජිටල් පරිවර්තන සමඟ සමපාත වෙමින් කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමණාකරණ තොරතුරු ඒකකය(MIU) විසින් සියලු පාඨමාලා සඳහා බාධාවකින් තොරව, පරිශීලක-හිතකාමී අත්දැකීමක් සහිත බැංකු සහ ඩිජිටල් මුදල් පසුම්බි හරහා ආරක්ෂිතව සහ පහසුවෙන් ගෙවීම් කිරීමට හැකියාවැති මාර්ගගත ගෙවීම් වේදිකාවක්(online payment platform) හඳුන්වා දීමට කටයුතු සුදානම් කර ඇත. මෙමගින් ඔබට පහසු ලෙස මුදල් ගෙවීම සිදු කිරීමට උපකාරී වේ.


මෙම ගෙවීම් සිදු කිරීම පහත මාර්ගෝපදේශ අනුව සිදු කල හැක .

### 1. පද්ධතියට පිවිසීම (Accessing the System)

i. web browser එකක් විවෘත කරන්න.


ii. පහත වෙබ් ලිපිනය browser එකේ address bar එකට දැමීමෙන් හෝ click කිරීමෙන් වෙබ් අඩවියට පිවිසෙන්න:
[https://dtet.gov.lk](https://dtet.gov.lk)

iii. පිවිසීමෙන් පසු පිටුවේ ඇති **"Application status"** බොත්තම මත *click* කරන්න.



## 2. **ගෙවීම සිදු කිරීම** (Making the Payment)


පහත වෙබ් පිටුව ලබා ගැනීමෙන් අනතුරුව ජාතික හැඳුනුම්පත් අංකය “NIC” ඇතුලත් කර Check බොත්තම මත click කරන්න.




එවිට පහත දැක්වෙන ආකාරයේ පිටුවක් දිස් වනු ඇත.


- ✔ Received Status – මාර්ගගත අයදුම්පත(Online Application) පද්ධතියට ඇතුලත් වී ඇති බව
- ✔ Qualified Status - සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලබා ඇත.
- ✔ Selected Status – පාඨමාලාව සඳහා තෝරාගෙන ඇත. (මෙහිදී SMS පණිවිඩයක් මගින් අදාල දැනුම්දීමක් ලබාදෙනු ලැබේ.)

දැන් Get Reference Number බොත්තම මත Click කරන්න




සටහන – සියළු පාඨමාලා සඳහා ගෙවීම් සිදු කල යුතු ආකාරය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සිසුන් බඳවා ගැනීමේ ගැසට් පත්‍රයක් මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ.


2025 ගැසට් පත්‍රය - https://dtet.gov.lk/en/download-categories/general-downloads/






ඔබ තෝරාගත් පාඨමාලාව සඳහා ගෙවිය යුතු ලියාපදිංචි සහ පාඨමාලා ගාස්තු තෝරාගන්න.

* පාඨමාලා ගාස්තු සම්පූර්ණ(Full Payment) හෝ වාරික(Installment) වශයෙන් ගෙවීම් සිදු කල හැක.

ගෙවීම් සිදු කිරීම සඳහා අවශ්‍ය යොමු අංකය (Reference No) ලබා ගැනීම සඳහා Generate බොත්තම මත click කරන්න.








දැන් ඔබට පහසු බැංකු හෝ මූල්‍ය තාක්ෂණ හවුල්කාරිත්වයන් යුත් යෙදුමක් මගින් ඉහත යොමු අංකය (Reference No) භාවිතා කරමින් ලියාපදිංචි සහ පාඨමාලා ගාස්තු ගෙවිය හැක.

(මෙහිදී සාර්ථකව ගාස්තු කල බවට SMS පණිවිඩයක් මගින් දැනුම්දෙනු ලැබේ.)

## 3. **ගෙවීම පරීක්ෂා කිරීම (Checking payment)**





ඉහත ① සහ ② පියවර නැවත අනුගමනය කරන්න.

ගෙවීම සාර්ථකව සිදු වූයේ නම් ඉහත ආකාරයේ වෙබ් පිටුවක් දිස් වනු ඇත.


## 4. **පාඨමාලාව සඳහා ලියාපදිංචි වීම (Course Registration)**

Click to registration බොත්තම මත click කරන්න. පහත දැක්වෙන ආකාරයේ වෙබ් පිටුවක් දැක ගත හැකි වේ.




දැන් Register බොත්තම මත click කරන්න.


සාර්ථකව ලියාපදිංචි වූයේ නම් ඔබගේ පුහුණු අංකය සහ මුරපදය SMS සහ Email පණිවිඩයක් මගින් දැනුම්දෙනු ලැබේ.




පද්ධතිය මගින් නිවැරදිව ලියාපදිංචි වීම් හෝ ගෙවීම් තහවුරු නොවීම් සම්බන්ධ ගැටළු කළමණාකරණ තොරතුරු ඒකකය මගින් විසදා ගත හැක. (7 කොටස බලන්න)

බැංකු හෝ වෙනත් යෙදුම් මගින් සිදු කරන ගෙවීම් සම්බන්ධව කිසිදු වගකීමක් දෙපාර්තමේන්තුව දරනු නොලැබේ.

## 5. **ශිෂ්‍ය ද්වාර පිවිසුම (Student portal Login)**





ඉහත 4 හි සදහන් Student portal සබැදිය මගින් හෝ පහත වෙබ් ලිපිනය වෙත ගොස් පද්ධතියට පිවිසෙන්න

https://mis.dtet.gov.lk/student/public/studentlogin

## 6. **ශිෂ්‍ය බඳවා ගැනීම (Enrollment)**

අවුරුද්දකට වඩා වැඩි පාඨමාලා ගාස්තු වාරික වශයෙන් ගෙවීම් සිදු කර ගැනීමේදී මෙම කොටස භාවිතා කරයි . එවිට Payment Plan වශයෙන් installment ලෙස සැකසි ඇත.

වාරික ගෙවන සෑම විටම Enrxxxxx වශයෙන් ඔබට යොමු අංකයක් ලැබේ.②කොටසේ පැහැදිලි කල පරිදි ගෙවීම් එම නව යොමු අංකය මගින් සිදු කල යුතුය.ගෙවීම සාර්තක වූයේ නම් යොමු අංකය ඉදිරියේ Status→ Paid ලෙස සටහන් වේ.




## 🔔 **විශේෂ සටහන**

*ලියාපදිංචි ගාස්තු සහ පාඨමාලා ගාස්තු ගෙවීමෙන් පසු, ගෙවීම් තොරතුරු පද්ධතිය මගින් වහාම යාවත්කාලීන නොවී තිබිය හැකිය.*

*මෙවන් අවස්ථාවකදී, කරුණාකර කෙටි වේලාවකින් පසුව නැවත **ශිෂ්‍ය ද්වාරය (Student Portal)** පරීක්ෂා කරන්න.*

*🔄 ගෙවීම් තොරතුරු යාවත්කාලීන වීමට යම් කාලසීමාවක් ගත විය හැකි බැවින්, වාරිකය දෙවරක් ගෙවීමෙන් වළකින්න.*

## **7. ප්‍රශ්න ඇත්නම් (Need Help?)**

**සහාය ලබා ගැනීම සඳහා:**

- Email: miu@dtet.gov.lk
- දුරකථන අංක: 011-2423393/0112336406